**දැන්වීමයි**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරි තනතුරට කුසලතාවය මත උසස් කිරීම**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු අධිකාරි තනතුරෙහි පවතින පුරප්පාඩු 08ක ප්‍රමාණයක් කුසලතා පදනම මත පිරවීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් සුදුසුකම් ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරෙහි සේවය කරන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021.06.21 දින වේ.

සටහන : ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය**

නිවේදනයේ දක්වා ඇති සුදුසකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. **සුදුසුකම්**

2.1. **පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම්**

I. ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරේ වසර 05 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලියක් ඇති නිලධාරියෙකු වීම හා තනතුරේ ස්ථිර කර තිබීම

II. ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

III. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

IV. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (පූර්වාසන්න සතුටුදායක සේවා කාලය තීරණය කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයක් හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන් අදාළ කරගනු ලැබේ.)

V. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

2.2 **කායික සුදුසුකම්**

I. සෑම අපේක්ෂකයෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 වෙනත්

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
II. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය ඉහත සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි.**

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන ඊට අනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව මට්ටම වසර තුනක් (03) තුළදී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු නියෝග, රජය මගින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත්වේ.

**04. වයස් සීමාව**

අදාළ නොවේ.

**05. වැටුප් පරිමාණය**

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895 (SL-1-2016) වේ.

**06. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| අනු අංකය | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | <u>ජ්‍යෙෂ්ඨතාවය</u><br>ඉහත අනු අංක 2.1.1 හි සඳහන් ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරේ වසර 05ට පසුව එළඹෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා<br><br>(රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හි සඳහන් විධිවිධානයන්ට හා එහි සංශෝධනයන්ට අනුකූලව වැඩිම සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී ඒ අනුව අනුපාතිකව සෙසු අයදුම්කරුවන්ට ලකුණු ගණනය කිරීම සිදුවේ.) | | 40 |

| | | | |
|---|---|---|---|
| 02 | <u>කාර්ය සාධන ඇගයීම (පූර්වාසන්න වසර 05හි)</u> | | 20 |
| | I. විශිෂ්ඨ | 04 | |
| | II. සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | 02 | |
| 03 | <u>සාධු සටහන් ප්‍රශංසා (ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරෙහි)</u> | | 15 |
| | I. විශේෂ සාධු සටහන් එකකට | 04 | |
| | II. සාමාන්‍ය සාධු සටහන් එකකට | 03 | |
| | III. ප්‍රශංසා | 01 | |
| 04 | <u>ක්ෂේත්‍රට අදාල අධ්‍යාපන සුදුසුකම්</u> | | 10 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, | | |
| | I. පශ්චාත් උපාධිය | 10 | |
| | II. පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 07 | |
| | III. උපාධිය | 05 | |
| | සටහන:<br>උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු පසු ලබා ගත් සුදුසුකම්වලට පමණක් ලකුණු හිමිවන අතර දැනටමත් කාර්යක්ෂමතා කඩඉමක් ලෙස හෝ උසස් කිරීමක් සඳහා වූ සුදුසුකමක් ලෙස හෝ සලකා බලා ඇති සුදුසුකමට ලකුණු හිමි නොවේ. | | |
| 05 | <u>අදාල ක්ෂේත්‍රයේ පුහුණුවීම් (එක් සහතිකයක් සඳහා)</u> | | 10 |
| | I. වසරකට වඩා වැඩි | 10 | |
| | II. මාස 6කට වඩා වැඩි හා වසරක් දක්වා | 08 | |
| | III. මාස 3කට වඩා වැඩි හා මාස 6ක් දක්වා | 05 | |
| | IV. මාසයකට වඩා වැඩි හා මාස 3ක් දක්වා | 03 | |
| | V. සතියකට වඩා වැඩි හා මාසයක් දක්වා | 02 | |
| | VI. සතියකට වඩා අඩු | 01 | |
| | සටහන:<br>ඉහත කාලසීමා පූර්ණකාලීන පුහුණුවීම් සඳහා වන අතර ඒ අනුව අර්ධකාලීන පුහුණුවීම්වල කාලසීමා තීරණය කිරීමේ දී එක් වර්ෂයක පූර්ණකාලීන පුහුණුවකින් පුහුණු පැය 1500ක් ආවරණය වන බව සලකා අදාළ පරිවර්තනයන් සිදු කරනු ඇත. | | |
| 06 | <u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම</u> | | 05 |
| | I. නායකත්වය | 02 | |
| | II. සන්නිවේදන කුසලතා | 02 | |
| | III. පෞරුෂත්වය | 01 | |
| | මුළු එකතුව | | 100 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛනවලට ලකුණු ලබා දෙනු නොලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම:-

i. ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මෙම නිවේදනය අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව, අයදුම්පත් සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්, 2021.06.21 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය

ii. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

iii. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " සුරාබදු අධිකාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

08. සාවද්‍ය තොරතුරු සැපයීම:-

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
එස්. ආර්. ආටිගල
මුදල් අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේ...
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.